# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/298/2025 (PSC)**

ඊ.ජී.ලොකුඋමගිලියගේ
**අභියාචක**

**එදිරිව,**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය : 2026.02.12**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක නැත. අභියාචක වෙනුවෙන් දිවුරුම් ප්‍රකාශයක් මත අභියාචකගේ පියා එල්.යූ.ප්‍රේමදාස පෙනී සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක ඒ.එම්.වන්සේකර මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් කේ.ඩී.එන්.එම්. දේශප්‍රිය මහත්මිය.

**-<u>නියෝගය</u>-**

අභියාචක වෙනුවෙන් ඇයගේ පියා වන එල්.යූ.ප්‍රේමදාස යන අයට බලය පවරා ඇති බවට සඳහන් කරමින් එංගලන්තයේ ග්ලාස්ගෝ නුවරදී සහතික කරන ලද දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇත. ඉදිරිපත් වී ඇති කරුණු සළකා බලමු. අභියාචක විසින් ඉදිරිපත් කර ඇති 2025.10.22 වන දිනැති අභියාචනා පෙත්සමෙන් ඉල්ලා ඇත්තේ, ඇයට වේතන රහිතව නිවාඩු ලබා දෙන ලෙස සහ ඇයව නැවත සේවයේ පිහිටු වීමට කටයුතු කරන ලෙසයි. අභියාචකට පිටපතක් සහිතව රාජ්‍ය පරිපාලන පලාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් ආණ්ඩුවේ රස පරීක්ෂක වෙත යවා ඇති 2025.10.24 දිනැති ලිපියේ සඳහන් වන්නේ, අභියාචක නැවත සේවයේ පිහිටු වීමට කරන ලද ඉල්ලීම සළකා බැලීමට තරම් ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් කර නොමැති හෙයින් එම අභියාචනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කිරීමට තීරණය කර ඇති බවයි. ඒ අනුව පෙනී යන්නේ, මේ වන විට අභියාචක 2023.11.30 දින

සිට බලපැවැත්වෙන පරිදි තනතුර අතහැරයාමේ නිවේදනය නිකුත් කර ඇති බවයි.

ඇය විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සමේ සඳහන් කර ඇත්තේ, ආචාර්ය උපාධිය සඳහා ශිෂ්‍යත්වයක් ලබා දී තිබූ හෙයින් වේතන රහිතව ඇයට නිවාඩු ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන ලද බවයි. එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති බව එහි වැඩිදුරටත් සඳහන් වේ. එසේ නිවාඩු ප්‍රතික්ෂේප කර තිබියදී අභියාචක 2023.12.05 දින විදෙස් ගත වී ඇත. ඒ අනුව පෙනී යන්නේ, ඇය විසින් හදාරනු ලබන පාඨමාලාව සළකා බලා ඇයව නැවත සේවයේ පිහිටු වන ලෙසයි.

මෙම කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති 2026.01.20 වාර්තාව කෙරෙහි අවධානය යොමු කරන ලදී. එහි 4 වන ඡේදයේ මෙසේ සඳහන් වේ.

*4. නිලධාරිනියගේ අභියාචනයෙහි සඳහන් කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් වාර්තාවක් කැඳවන ලද අතර එම වාර්තාව සමඟ යොමු කර ඇති ආණ්ඩුවේ රස පරීක්ෂකගේ වාර්තාව පහත නිරීක්ෂණ ඉදිරිපත් කරමින් අභියාචක නැවත මේවයේ පිහිටුවීමට නුසුදුසු බවට නිර්දේශ කොට ඇති බව.*

- *අභියාචක වෙත රජයේ වියදමින් දේශීය හා විදේශීය පශ්චාත් උපාධි අවස්ථා දෙකක්ස ලබා දී තිබීම.*
- *දෙපාර්තමේන්තු බඳවාගැනීමේ පටිපාටි අනුව ආචාර්ය උපාධිය සම්පූර්ණ කිරීම සේවා අවශ්‍යතාවයක් නොවීම.*
- *නිලධාරිනිය වැටුප් රහිත විදේශ නිවාඩු අයදුම් කරන අවස්ථාව වනවිටත් ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ගේ පුරප්පාඩු 26ක් පැවතීම.*
- *නිලධාරිනිය 2023.11.30 දින සිට සේවයට වාර්තා නොකිරීම සහ එදිනට පසුව සිදු කරන ලද වැටුප් රහිත නිවාඩු ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ප්‍රතිපාදන නොමැති වීම.*
- *ඇය තවදුරටත් විදේශගතව සිටීම.*

ඉහතින් සඳහන් කර ඇති, අභියාචකගේ සේවා වාර්තාව සම්බන්ධයෙන් වන කරුණු ප්‍රතික්ෂේප කළ නොහැක. ඒවා විවාදයට ලක් නොවේ. ඒ අනුව මෙම කරුණු ඒ ආකාරයෙන් පවතින බවට තීරණය කරමු.

එම කරුණු සළකා බැලීමේදී පෙනී යන්නේ, අභියාචක සේවය හැර යාමේ දිනට පෙර, රජයේ වියදමින් දේශීය හා විදේශීය පශ්චාත් උපාධි අවස්ථා දෙකක්ම ලබා ගෙන ඒවා භුක්ති විඳ ඇති බවයි. දැනට ඇය අධ්‍යනය කරනු ලබන උපාධිය සේවා අවශ්‍යතාවයක් පිළිබඳව නොවන බවටත් එහි වැඩි දුරටත් සඳහන් වේ. අභියාචක දැනටමත් විදෙස්ගතව අධ්‍යාපන කටයුතු වල නිරතව සිටී.

එම කරුණු සළකා බැලීමේදී ඇය විසින් ඉල්ලා ඇති සහනයන් ලබා දීමට විනිශ්චය අධිකාරය කැමැත්තක් දක්වන්නේ නැත. ඉහත කරුණු සළකා බලා ඉදිරිපත් කර ඇති අභියාචනය නිෂ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

අභියාචනය නිෂ්ප්‍රභා කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/